# 10 ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

## හැඳින්වීම

ක්‍රිස්තු වර්ෂයෙන් දෙවන සහස්‍රක වර්ෂයේ මුල් භාගයේ පටන් දකුණු යුරෝපය කේන්ද්‍රකොට ගෙන ඇති වන නව වෙළෙඳ ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපීය ජාතීහු විශේෂයෙන් ම නැගෙනහිර රටවල්වලට සිය අවධානය යොමු කළහ. ඊට පසුබිම් වූයේ එම රටවල තිබෙන විවිධ සම්පත් වෙළෙඳාමට ලබා ගැනීම යි.

ඉන්දියානු සාගරයේ වෙළෙඳාමට සම්බන්ධවීමට අදාළ දීර්ඝ ඉතිහාසයක් සතු වූ ශ්‍රී ලංකාව යුරෝපීය ජාතීන් සමඟ කටයුතු කළ ආකාරය තුළ යම් යම් විශේෂතා දැකිය හැකි ය. වෙළෙඳ අරමුණු අබිබවා දේශපාලනික අරමුණු ඉස්මතු වීම නිසා මෙම යුගයේ දී ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය අතර පැවති සබඳතාවල කැපී පෙනෙන ප්‍රතිවිරෝධතා මාලාවක් දැකිය හැකි ය. විදේශිකයාගේ ආධිපත්‍යයත් ඊට එරෙහිව නැගුණු ස්වදේශිකයාගේ ප්‍රතිවිරෝධතාත් අතර පැවති ප්‍රතික්‍රියා මාලාවක් මෙම යුගයේ දී දක්නට තිබේ. මෙම පාඩමෙන් එම කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට නියමිත ය.

## 10.1 පෘතුගීසීන් ආසියාවට පැමිණීම

ඈත අතීතයේ සිට ම ආසියාව හා යුරෝපය අතර වෙළෙඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුනක් තිබුණි.

1. කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියාව, මධ්‍ය ආසියාව හරහා චීනය දක්වා වැටී තිබූ මාර්ගය හෙවත් සේද මාවත

2. කොන්ස්තන්තිනෝපලයේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ මිසරය, රතු මුහුද හරහා ඉන්දියාණු සාගරයට පැමිණි මාර්ගය

3. කොන්ස්තන්තිනෝපලයේ සිට බැග්ඩෑඩ්, පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණි මාර්ගය

මෙම මාර්ග ඔස්සේ වෙළෙඳ සබඳතා පැවැත්වීමේ දී ගොඩබිම් ප්‍රදේශවල දී භාණ්ඩ ප්‍රවාහනය සඳහා තවලම් භාවිත කළ අතර මුහුදු ගමන්වල දී නැව් භාවිත කෙරිණි. මධ්‍යතන යුගය වන විට ආසියානු වෙළෙඳාමේ ඒකාධිකාරය මුස්ලිම් ජාතිකයන් සතු විය. මුස්ලිම්වරු ආසියාවේ කුළුබඩු ඇතුළු භාණ්ඩ එක් රැස් කර යුරෝපීයන්ට විකිණීමෙන් අධික ලාභයක් ලැබූහ. ඉහත කී වෙළෙඳ මාර්ග තුන ම කොන්ස්තන්තිනෝපල් නගරය හා සම්බන්ධ වී තිබූ බැවින් යුරෝපීය ක්‍රිස්තු භක්තිකයන් යටතේ තිබූ එම නගරය පෙර අපර දෙදිග වෙළෙඳාමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත්ව තිබුණි. එහෙත් වර්ෂ 1453 දී ඉස්ලාම් ආගම ඇදහූ තුර්කිවරු මෙම නගරය යටත් කර ගැනීම නිසා ආසියාව හා යුරෝපය අතර සාම්ප්‍රදායික වෙළෙඳාමට පහර වැදුණි.

කොන්ස්තන්තිනෝපල් නගරය (වර්තමාන ඉස්තාන්බුල්) ඉස්ලාම් භක්තිකයන් සතු වීම නිසා යුරෝපීය ක්‍රිස්තියානින්ට විශාල පාඩුවක් සිදු විය. එම නගරය අල්ලා ගත් මුස්ලිම්වරු ආසියාවේ කුළු බඩුවල මිල ඉහළ නැංවීම, භාණ්ඩ හිඟයක් ඇති කිරීම හා කලට වේලාවට භාණ්ඩ නොසැපයීම ආදිය මඟින් යුරෝපීයන්ට මහත් දුෂ්කරතා ඇති කළහ. යුරෝපීයන් දිගු කලක සිට ආසියාතික කුළු බඩු පරිභෝජනයට හුරු වී සිටි බැවින් කුරුඳු, ගම්මිරිස්, ඇතුළු කුළු බඩු සඳහා යුරෝපා වෙළෙඳ පොළේ හොඳ ඉල්ලුමක් තිබුණි. මේ වන විට ඉහත කී සාම්ප්‍රදායික වෙළෙඳ මාර්ග ඉස්ලාම් භක්තිකයන් යටතට පත්ව තිබුණු බැවින් ආසියාවට පැමිණීමට නව මාර්ග සෙවීමේ අභියෝගයකට යුරෝපීයෝ මුහුණ දුන්හ. එහි දී පෘතුගීසීහු පෙරමුණ ගෙන කටයුතු කළහ.

පෘතුගීසීන්ගේ මව්රට පෘතුගාලය වේ. පෘතුගාලය යනු නිරිත දිග යුරෝපයේ අයිබීරියන් අර්ධද්වීපය තුළ පිහිටි රටකි. එසේම පෘතුගාලය අත්ලාන්තික් සාගරයට මුහුණලා පිහිටා තිබේ. මේ නිසා පෘතුගීසීන්ට තම විදේශ සබඳතා පැවැත්වීමට සිදු වූයේ මුහුදු මාර්ග මඟිනි. එහි ප්‍රතිඵල වශයෙන් අතීතයේ සිට ම පෘතුගීසීහු සමුද්‍ර කටයුතු පිළිබඳ හොඳ නිපුණතාවක් දැක්වූහ. 15 වන සියවසේ පෘතුගාලයේ සිටි හෙන්රි කුමරු නොහොත් නාවුක හෙන්රි දේශ ගවේෂණ කටයුතු ගැන මහත් උනන්දුවක් දැක්වූ අයෙකි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.




*ඡායාරූපය අංක 10.1 පැරණි ගොඩනැගිල්ලක කැටයම් කර තිබෙන ලන්දේසීන්ගේ ලාංඡනය.*

පෘතුගාලයෙහි නාවුක විද්‍යාලයක් පවත්වාගෙන ගිය හෙතෙම නාවික ශිල්පය, සිතියම් විද්‍යාව, තාරකා ශාස්ත්‍රය වැනි විෂයන් එහි ඉගැන්වීය. මෙම කරුණු නිසා ආසියාවට නව මුහුදු මාර්ගයක් සෙවීමේ කටයුතුවල දී සෙසු යුරෝපීයයන්ට වඩා පෘතුගීසීහු ඉදිරියෙන් සිටියහ. පෘතුගීසි ජාතිකයෙකු වූ වස්කෝද ගාමා අප්‍රිකාව වටා ගමන් කොට වර්ෂ 1498 දී ඉන්දියාවේ කැලිකට්වලට පැමිණීමත් සමඟ ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය ආරම්භ විය. පෘතුගීසීන් ආසියාවට පැමිණීමෙන් පසුව ලන්දේසි, ඉංග්‍රීසි, ප්‍රංශ වැනි සෙසු යුරෝපීයයෝ ද ආසියාවට පැමිණ විවිධ ප්‍රදේශවල තම බලය පැතිර වූහ. මෙසේ 16 වන සියවස ආරම්භයේ සිට වසර 450 ක් පමණ ආසියාවේ යුරෝපා බල ව්‍යාප්තිය පැවතුණි.

යුරෝපීයයන් ආසියාවට පැමිණියේ අරමුණු කිහිපයක් ඇතිවය. ආර්ථික වාසි ලබා ගැනීම, ආගම ප්‍රචාරය කිරීම හා ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම වැනි හේතු ඒ අතර ප්‍රධාන ඒවා විය. 16 වන සියවසේ සිට 20 වන සියවස දක්වා කාල පරිච්ඡේදයේ යුරෝපයේ සිදු වූ දේශපාලන හා ආර්ථික වෙනස් වීම් අනුව යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණුවල ද යම් යම් වෙනස්කම් ඇති විය.

පෘතුගීසීන් ආසියාවට පැමිණීමේ මූලික අරමුණ වූයේ ආර්ථික වාසි ලබා ගැනීම හා රෝමානු කතෝලික ආගම ප්‍රචාරය කිරීම යි. පෘතුගීසීන් පැමිණෙන විට ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය මුස්ලිම්වරුන් සතුව පැවතුණු හෙයින් ඔවුන් පරාජය කොට එම වෙළෙඳ ඒකාධිකාරය තමන් වෙතට ලබා ගැනීම පෘතුගීසීන්ගේ අරමුණ විය. එමඟින් අති විශාල ලාභයක් ලැබිය හැකි බව පෘතුගීසීහු දැන සිටියහ. වස්කෝදගාමා කැලිකට්වලට පැමිණීමෙන් පසු "ක්‍රිස්තියානීන් සහ කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු" යැයි ප්‍රකාශ කොට තිබීමෙන් පෘතුගීසින් තුළ පැවති ආර්ථික හා ආගමික අරමුණ පැහැදිලි වේ. වස්කෝදගාමාට පසුව ඉන්දියාවට පැමිණි දෙවන පෘතුගීසි නාවික කණ්ඩායමට පෘතුගාලයෙන් ලැබී තිබූ උපදෙස්වල

වෙළෙඳ ගබඩාවක් ඉදි කිරීමට අමතරව පූජකයන් පස් දෙනෙකුට පැමිණ ධර්මය දේශනා කිරීම සඳහා කැලිකට්වල පාලකයාගෙන් අවසර ලබා ගන්නා මෙන් සඳහන් විය. මුල් කාලයේ සිට තමන්ගේ බලය ව්‍යාප්ත වන ප්‍රදේශවල ස්වකීය ආගම පැතිර වීමේ අරමුණක් ද පෘතුගීසීන් තුළ පැවති බව මෙයින් පැහැදිලි වේ.

## 10.2 පෘතුගීසීන් පැමිණි අවධියේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ මුහුදු වෙළෙඳ මාර්ග ආශ්‍රිත වැදගත් මධ්‍යස්ථානයක් වශයෙන් පිහිටි බැවින් යුරෝපීයයන්ගේ ආසියාතික කටයුතු වල දී වාණිජමය හා යුදමය වැදගත්කමක් මෙරටට ලැබී තිබුණි. පෘතුගීසීන් මුල් කාලයේ දී සෙයිලන් වශයෙන් හඳුනා ගෙන සිටි මෙරට තුළ ඉතා හොඳ තත්ත්වයේ කුරුඳු නිපදවෙන බව ද පෘතුගීසීහු දැන සිටියහ. මේ නිසා ඉන්දියාවට පැමිණ නොබෝ කලකින් ම ලංකාව කෙරෙහි ද පෘතුගීසින්ගේ අවධානය යොමු විය. වර්ෂ 1505 මාර්තු මාසයේ දී පෘතුගාලයේ රජු විසින් පෙරදිග පෘතුගීසී ප්‍රතිරාජයා වශයෙන් ෆැන්සිස්කු ද අල්මේද පත් කර එවන ලදී. පෘතුගාල පාලකයා අල්මේදට ලබා දී තිබූ උපදෙස් අතර සෙයිලන් (ලංකාව) සොයා ගත යුතු ය යන උපදේශය ද ඇතුළත් විය. ෆැන්සිස්කු ද අල්මේදගේ පුතෙකු වූ ලොරෙන්සෝද අල්මේද ගමන්ගත් නැව් කණ්ඩායමක් කුණාටුවකට හසු වී අහම්බෙන් මෙරටට පැමිණි හෙයින් පෘතුගාල රජුගේ එම අරමුණ ඉටු විය.

වර්ෂ 1505 දී ලොරෙන්සෝ ද අල්මේද ඇතුළු මුල් ම පෘතුගීසි කණ්ඩායම මෙරටට පැමිණෙන විට ශ්‍රී ලංකාව තුළ දේශපාලන එක්සත්කමක් නොතිබූ බැවින් විදේශීය බල ව්‍යාප්තියකට සුදුසු පසුබිමක් පැවතුණි. හයවන පරාක්‍රමබාහු රජතුමා කෝට්ටේ රාජධානිය පිහිටුවා රට එක්සත් කොට දේශපාලන ස්ථාවරත්වයක් ඇති කොට තිබූ නමුත් එතුමාගේ අභාවයෙන් පසුව කාලයක් ගත වන විට එම එක්සත්කම බිඳ වැටුණි. මේ නිසා පෘතුගීසීන් පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයට අමතරව උඩරට හා යාපනය වශයෙන් තවත් රාජධානි දෙකක් බිහි වී තිබුණි. ලංකාවට පැමිණි පෘතුගීසීහු මුලින්ම කෝට්ටේ රාජ්‍ය සමඟ සබඳතා ගොඩනගා ගත්හ. පෘතුගීසීන් කොළඹට පැමිණි අවස්ථාවේ දී ඔවුන්ගේ නියෝජිතයන් රජු හමුවීමට කැඳවාගෙන යන විට කොළඹ සිට වට වංගු සහිත මාර්ගයක් ඔස්සේ ඔවුන් කැඳවාගෙන ගිය බව කියවේ. කොළඹ හා කෝට්ටේ ප්‍රදේශය අතර දුර ප්‍රමාණය වැඩි කොට දැක්වීම පිණිස රජුගේ නියෝජිතයන් යෙදූ මේ උපාය නිසා"පරංගියා කෝට්ටේ ගියා වගේ " යැයි පිරුළක් ඇති වී තිබේ.

පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට විශාල රාජ්‍ය වශයෙන් පැවති කෝට්ටේ රාජ්‍ය 1521 දී ඇති වූ විජයබා කොල්ලයත් සමඟ කොටස් තුනකට බෙදී යාම පෘතුගීසි බල ව්‍යාප්තියට තවත් පහසු විය. කෝට්ටේ පාලකයා වශයෙන් සිටි අටවන වීර පරාක්‍රමබාහු රජුගෙන් පසු එතුමාගේ පුතෙක් වූ හයවන විජයබාහු කුමරා රජකමට පත් විය. විජයබාහු රජුගේ පළමුවන විවාහයෙන් සිටි පුතුන් තිදෙනා වන බුවනෙකබාහු, මායාදුන්නේ හා රයිගම බණ්ඩාර යන සහෝදර කුමාරවරුන්ට අනාගත රජකම නොපවරා දේවරාජ නම් වෙනත් කුමාරයෙකුට අනාගත රජකම උරුමකර දීමේ උත්සාහයක් නිසා ගැටුමක් ඇති විය. තමන්ට රාජ්‍ය උරුමය නොලැබීම පිළිබඳ ආරංචි වූ ඉහත කී කුමාරවරු තිදෙනා එවකට උඩරට පාලකයා වූ ජයවීර බණ්ඩාර රජුගෙන් ආධාර ලබාගෙන කෝට්ටේට පැමිණ රාජ්‍ය බලය ලබා ගැනීමට යාමේ දී සලමාන් නමැත්තකු විසින් විජයබාහු රජු මරණයට පත් කරන ලදී. හයවන විජයබාහු රජුගෙන් බලය ලබා ගැනීමට වර්ෂ 1521 දී ඇති වූ මෙම සිද්ධිය විජයබා කොල්ලය වශයෙන් හැඳින්වේ. විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙද ඉහත කුමාරවරු තිදෙනා අතර බෙද ගත්හ. ඒ අනුව කෝට්ටේ ප්‍රදේශයේ පාලකයා වශයෙන් හත්වන බුවනෙකබාහු බලයට පත් විය. මායාදුන්නේ කුමරු සීතාවක රජු බවට පත් වූ අතර රයිගම බණ්ඩාර රයිගම ප්‍රදේශයේ බලයට පත් විය. මෙසේ කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී යාමෙන් වැඩි වාසි අත් වූයේ මෙරට බලය පැතිරවීමේ අපේක්ෂාවෙන් සිටි පෘතුගීසීන්ට ය.

### ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල පෘතුගීසි බල ව්‍යාප්තිය

කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී වැඩි කල් යාමට පෙර හත්වන බුවනෙකබාහු රජු හා මායාදුන්නේ රජු අතර මතභේද ඇති විය. කෝට්ටේ රාජ්‍යයේ අනාගත රාජ්‍ය උරුමය පිළිබඳ ප්‍රශ්න සහ මායාදුන්නේ රජු කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශ කිහිපයක් අත්පත් කර ගැනීමට තැත් කිරීම මෙම මතභේදවලට හේතු විය.

බුවනෙකබාහු රජුට සමුද්‍රදේවිය යනුවෙන් හැඳින් වූ දියණියක් සිටි නමුත් කෝට්ටේ අනාගත උරුමය පැවරීමට පුතෙක් නොසිටියේය. එවකට රණශූරයෙකු වශයෙන් ප්‍රසිද්ධව සිටි වීදියෙ බණ්ඩාර, සමුද්‍ර දේවිය කුමරිය විවාහ කරගෙන සිටි අතර ඔවුන්ට ධර්මපාල හා විජයපාල යනුවෙන් පුතුන් දෙදෙනෙකු ලැබී තිබුණි. තම දියණියගේ පුතා වූ ධර්මපාල කුමරුට අනාගත රාජ්‍ය උරුමය පැවරීම බුවනෙකබාහු රජුගේ අපේක්ෂාව විය. කෝට්ටේ රාජ්‍ය ගැන අනාගත බලාපොරොත්තු ඇති කරගෙන සිටි මායාදුන්නේ රජු බුවනෙකබාහු රජුගේ මෙම තීරණයට කිසිසේත් කැමති නොවීය. විජයබා කොල්ලයේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ මායාදුන්නේ රජු රණශූරයෙකු වූ අතර උඩරට සිටි ජයවීර බණ්ඩාර රජුගෙන් ද ඔහුට ආධාර ලබා ගැනීමේ හැකියාවක් තිබුණි. මේ නිසා මායාදුන්නේ රජුගෙන් කෝට්ටේ රාජ්‍යයට කරදර පැමිණෙතැයි බිය වූ බුවනෙකබාහු රජු තම ආරක්ෂාව සඳහා පෘතුගීසීන් කැඳවා ගත්තේය. මෙසේ කෝට්ටේ හා සීතාවක රාජධානි අතර පැවති මතභේද නිසා කෝට්ටේ ආරක්ෂකයන් වශයෙන් අගනුවරට ඇතුළු වූ පෘතුගීසීහු එම රාජ්‍යයේ සියලු කටයුතුවලට ඇඟිලි ගසමින් තම බලය පතුරුවා හැරීමේ උපායශීලී ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළහ.

පෘතුගීසීන් හා මුස්ලිම්වරුන් අතර වෙළෙඳ තරගයක් පැවති හෙයින් මෙරට මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි බලකොටු ඉදිවනු දැකීමට මුස්ලිම්වරු කැමති නොවූහ. අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍ය තුළ සිටි මුස්ලිම්වරුන්ට එරෙහිව කටයුතු කිරීමට බුවනෙකබාහු රජු පොලඹවා ගත්තේය. මේ නිසා වෙරළබඩ ප්‍රදේශවල සිටි මුස්ලිම්වරුන්ගේ සහාය සීතාවක මායාදුන්නේ රජුට ලැබුණි. ලංකාවේ සිටි මුස්ලිම්වරුන්ගේ ඉල්ලීම මත ඉන්දියාවේ කැලිකට්වල පාලකයා වූ සැමොරින් පෘතුගීසීන්ට එරෙහි ප්‍රහාර සඳහා මායාදුන්නේ රජුට නාවික සහය ලබා දීමට ඉදිරිපත් විය. සැමොරින්ගේ ආධාර මත මායාදුන්නේ රජු විසින් පෘතුගීසීන්ට එරෙහි ප්‍රහාර කිහිපයක් දියත් කරන ලද නමුත් පෘතුගීසීන් සතුව තිබූ නාවික බලය හා අවි බලය ඉදිරියේ එම සටන්වලින් සාර්ථක ප්‍රතිඵල නොලැබිණි.

බුවනෙකබාහු රජු ජීවත්ව සිටිය දී සීතාවක හා කෝට්ටේ රාජධානිය අතර ගැටුම් කිහිපයක් ඇති විය. මෙම ගැටුම්වල දී පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ ආරක්ෂාව වෙනුවෙන් සටන් කළ අතර පෘතුගීසීන්ගේ යුද වියදම ගෙවීමට රජුට සිදු විය. බුවනෙකබාහු රජු පෘතුගීසීන්ගේ සහය ලබා ගත් නමුත් ඔහු පෘතුගීසි ගැති පාලකයෙක් බවට පත් වූයේ නැත. රජු කතෝලික ආගමට හරවා ගැනීමට පෘතුගීසින් උත්සාහ දැරුවත් හෙතෙම එය ප්‍රතික්ෂේප කළේය. මේ නිසා කලක් ගත වන විට බුවනෙකබාහු රජු හා පෘතුගීසීන් අතර මත ගැටුම් උත්සන්න විය. ආගමික හේතුවලට අමතරව පෘතුගීසීන් කෝට්ටේ වැසියන්ට ඉතා අධික මිලට තම භාණ්ඩ විකිණීමත්, කෝට්ටේ නිෂ්පාදන අවම මිලට ලබා ගැනීමත් වැනි ආර්ථික කරුණු ද මේ සඳහා බලපෑවේය. මෙම මත ගැටුම් අවසන් වූයේ පෘතුගීසි වෙඩි පහරකින් බුවනෙකබාහු රජු මරණයට පත්වීමෙනි. කුතෝ නම් පෘතුගීසි ලේඛකයා වාර්තා කර ඇති පරිදි වර්ෂ 1550 දෙසැම්බර් 29 දින රජුගේ මරණය සිදුව ඇත.

බුවනෙකබාහු රජු ජීවත්ව සිටිය දී තම මුණුබුරු ධර්මපාල කුමරුගේ පිළිරුවක් පෘතුගාලයට යවා එරට රජු අතින් එම පිළිරුවට ඔටුනු පැළඳවීමට කටයුතු යෙදීම මගින් කුමරාට අවශ්‍ය පෘතුගීසි රැකවරණය නොඅඩුව ලබා දී තිබුණි. මේ නිසා බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසුව පෘතුගීසි ආරක්ෂාව මධ්‍යයේ ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා බවට පත් විය. ධර්මපාල රජු පෘතුගීසි රූකඩ පාලකයෙකු බවට පත් වීමත් කතෝලික ආගම වැළඳ ගැනීමත්, තම රාජධානිය තුළ එම ආගම පැතිර වීමට ඉඩ සලසා දීමත්, කෝට්ටේ වැසියන්ට පෘතුගීසීන්ගෙන් සිදු වන අකටයුතුකම් වැළැක්වීමට ක්‍රියා නොකිරීමත් නිසා ඔහුට මහජන සහාය නොලැබ ගියේය. මේ නිසා ආරක්ෂාව පතා දළදව පවා සීතාවකට වැඩම කෙරිණි. වර්ෂ 1551 සිට 1597 දක්වා ධර්මපාල රජු නාමික රජෙකු වශයෙන් සිටියත් මේ කාලයේ කෝට්ටේ නියම පාලකයන් බවට පත් වූයේ පෘතුගීසීන් ය. ධර්මපාල රජු තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරීම නිසා එම රජුගේ මරණයෙන් පසු කෝට්ටේ පාලනයට පෘතුගීසීන්ට නිත්‍යානුකූල අයිතියක් ද ලැබුණි.

### වීදියෙ බණ්ඩාර

බුවනෙකබාහු රජුගේ දියණිය වූ සමුද්‍රදේවිය විවාහ කරගෙන සිටි වීදියේ බණ්ඩාර දක්ෂ රණශූරයෙකි. තම පුත් ධර්මපාල රජුගේ පාලනය ආරම්භ වූ අවධියේ දීම පෘතුගීසීන් කෝට්ටේ රජ මාලිගය කොල්ල කෑමත්, කෝට්ටේ වැසියන්ට ඔවුන් නොයෙකුත් අකටයුතුකම් කිරීමත් නිසා වීදියේ බණ්ඩාර පෘතුගීසීන්ට එරෙහිව නැගී සිටියේය. මේ නිසා පෘතුගීසීන් විසින් ඔහු අත්අඩංගුවට ගෙන කොළඹ කොටුව තුළ සිරකර තබන ලදී. එහෙත් වීදියෙ බණ්ඩාරගෙ බිසව තම

සැමියා සිරකොට සිටි මැදිරියට රහසේ උමගක් කප්පවා ඔහු සිරෙන් නිදහස් කර ගත්තාය. අනතුරුව පස් යොදුන් කෝරලයේ පැළෑඳ ප්‍රදේශයට පලා ගිය හෙතෙම එහි බලකොටුවක් ගොඩනගා පෘතුගීසි විරෝධී සටනක් ආරම්භ කළේය. පෘතුගීසීන් කෙරේ කලකිරී සිටි කෝට්ටේ වැසියන්ගේ සහාය ද වීදියෙ බණ්ඩාරට ලැබුණි. වීදියෙ බණ්ඩාරගේ සටන් නිසා පෘතුගීන්ට බොහෝ අලාභ හානි සිදු විය. එසේම වීදියෙ බණ්ඩාරගෙ කටයුතු සීතාවක පාලකයන්ට ද මහත් හිසරදයක් විය. මේ නිසා මායාදුන්නේ හා පෘතුගීසීන් ඒකාබද්ධ වී පැළෑද බලකොටුව ආක්‍රමණය කොට වීදියෙ බණ්ඩාර පරාජයට පත් කළේය. අනතුරු උඩරට රාජධානියට පලාගිය හෙතෙම පසුව යාපනයට ගොස් සිටිය දී ඇති වූ ගැටුමකින් මරණයට පත් විය.

## සීතාවක රාජධානිය

සීතාවක රාජධානියේ පාලකයා වූ මායාදුන්නේ රජු එම රාජධානිය ආරම්භ වූ අවස්ථාවේ සිට ම පෘතුගීසී විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. කෝට්ටේ රාජ්‍ය තුළ පෘතුගීසී බලය වර්ධනය වීමත් සමඟ මායාදුන්නේ රජු කෝට්ටේ පාලකයන් හා පෘතුගීසීන් යන දෙපක්ෂයට ම එරෙහිව සටනට පෙලඹුණි. මේ නිසා ධර්මපාල රජු කෝට්ටේ පාලකයා බවට පත් වීමෙන් පසුව මායාදුන්නේගේ ප්‍රහාර තවත් දැඩි විය. වර්ෂ 1555 පමණ වනවිට මායාදුන්නේගේ පුත් ටිකිරි බණ්ඩාර කුමරු දක්ෂ රණශූරයෙකු ලෙස සීතාවක හමුදවට නායකත්වය දීමට ඉදිරිපත් වීම නිසා එම හමුදව තවත් ශක්තිමත් විය. වර්ෂ 1557 දී මායාදුන්නේ සියලු ශක්තිය යොද කෝට්ටේ නගරයට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කළේය. එහෙත් පෘතුගීසි කාල තුවක්කු ප්‍රහාර නිසා සීතාවක හමුදවට නගරයට ඇතුළු වීම අපහසු විය. අනතුරුව මායාදුන්නේ කෝට්ටේ නගරයෙන් බැහැර පිහිටි ප්‍රදේශවලට වරින්වර පහර දීමේ ප්‍රතිපත්තියක් අනුග මනය කළේය.

කෝට්ටේ නගරය වැටලීමේ සටන අසාර්ථක වීමෙන් පසු ටික කලක් ප්‍රබල ප්‍රහාරවලින් වැළකී සිටි සීතාවක පාලකයෝ අනතුරුව කෝට්ටේ හා කොළඹ කොටුවට එකවර පහර දීමේ සටනක් දියත් කළහ. මෙහි දී මායාදුන්නේ රජුගේ පුත් ටිකිරි කුමරු මෙහෙය වූ සීතාවක හමුදව හා පෘතුගීසීන් අතර මුල්ලේරියා වෙලේ දී දරුණු සටනක් ඇවිළුණි. පුරා දිනයක් තිස්සේ පැවති මේ සටනේ දී පෘතුගීසීහු අන්ත පරාජයක් ලැබූහ. එහි දී පෘතුගීසි පක්ෂයෙන් මිය ගිය සංඛ්‍යාව 1600 ක් පමණ වෙතැ යි වාර්තා වේ. මෙය ආසියානු රටක දී පෘතුගීසීන් ලැබූ දරුණුතම පරාජයකි.

කෝට්ටේ නගරයට සීතාවකින් වරින් වර එල්ල වූ ප්‍රහාර නිසා වර්ෂ 1565 දී පමණ ධර්මපාල රජු එම නගරය අතහැර දමා කොළඹ කොටුවේ පදිංචියට ගියේ ය. එසේම වර්ෂ 1581 දී පමණ මායාදුන්නේ රජු මිය ගිය අතර ටිකිරි බණ්ඩාර කුමරු රාජසිංහ නමින් සීතාවක රජ විය. රජ වී නොබෝ කලකින් ම හෙතෙම එවකට උඩරට පාලකයා වූ කරලියැද්දෙ බණ්ඩාර පලවා හැර එම රාජධානිය ද සීතාවකට ඈඳා ගත්තේය. මේ අනුව 1582 පමණ වන විට මෙරට පෘතුගීසීන්ගේ බලය කොළඹ කොටුව ඇතුළු සෙසු ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා කිරීමට රාජසිංහ රජුට හැකියාව ලැබුණි. මේ නිසා කෝට්ටේ රාජ්‍ය සතු ප්‍රදේශ බොහෝමයක් ද රයිගම රාජධානිය හා උඩරට රාජධානිය ද මුළුමනින් ම සීතාවකට යටත්ව තිබුණි.

රාජසිංහ රජු අවස්ථා දෙකක දී කොළඹ කොටුව වටලා පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උත්සාහ කළේය. එහෙත් පෘතුගීසීන් සතු වූ අවි ආයුධ බලය හා පෙරදිග පෘතුගීසි මූලස්ථානය වූ ගෝවෙන් පෘතුගීසීන්ට ආධාර ලැබීම නිසා එම අවස්ථා දෙකේ දී ම රජුගේ ප්‍රයත්නය අසාර්ථක විය. රාජසිංහ රජු 1587 දී දෙවන වර කොළඹ කොටුව වටලෑමේ දී බේරේ වැවේ ජලය ඇළ මාර්ගයක් කපා මුහුදට බස්සවා කොටුවට ඇතුළු වීමට උත්සාහ කළත් එය අසාර්ථක විය. සීතාවක රාජධානියට ප්‍රමාණවත් නාවික ශක්තියක් නොවීම මෙම සටන් අසාර්ථක වීමට තුඩු දුන් තවත් හේතුවකි. මෙසේ පෘතුගීසීන්ට එරෙහිව නිරන්තර සටනක යෙදී සිටි රාජසිංහ රජු උඩරට විමලධර්මසූරිය රජු හා කළ සටනකින් පරාජය වී ආපසු සීතාවකට පැමිණෙන විට පෙතංගොඩ උයනේ දී උණ කටුවක් ඇනීමෙන් ඇති වූ තුවාලයක් හේතුවෙන් මරණයට පත් විය. අනතුරුව සීතාවක රාජධානිය ද බිඳ වැටුණි. සීතාවක පාලකයන් නිරන්තර යුද්ධයක නියැළීමත්, රාජසිංහ රජු අවසන් කාලයේ අනුගමනය කළ බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියත්, රාජසිංහ රජුට උඩරට යටත් කර ගැනීමට උපකාර කළ වීරසුන්දර බණ්ඩාර මැරවීම නිසා උඩරට වැසියන්ගේ සහය අඩු වීමත්, වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර උඩරට රජ වීමත්. රාජසිංහ රජුගෙන් පසු රාජධානියට නිසි උරුමකරුවෙක් නොසිටීමත් වැනි කරුණු සීතාවක රාජධානියේ බිඳ වැටීමට හේතු වූ

බව සැලකිය හැකිය. එහෙත් සීතාවක පාලකයන් ගෙන ගිය පෘතුගීසි විරෝධී දේශප්‍රේමී සටන නිසා මෙරට පෘතුගීසී බල ව්‍යාප්තිය බොහෝදුරට සීමා වූ බව පිළිගත යුතු ය.

සීතාවක රාජධානියේ පරිහානි යුගයේ දී නැවතත් ශක්තිමත් වූ පෘතුගීසීහු එම රාජධානියේ බිඳ වැටීමත් සමඟ කෝට්ටේ හා රයිගම රාජධානිවලට අයත්ව තිබූ පෙදෙස් හා සීතාවක යටතේ තිබූ ඇතැම් ප්‍රදේශ අත්පත් කොට ගෙන මෙරට මුහුදුබඩ ප්‍රදේශ රැසක බලය පිහිටුවා ගත්හ.

### යාපන රාජධානිය

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව බිහි වූ යාපන රාජධානියේ පාලන කටයුතු මෙහෙයවන ලද්දේ ආර්ය චක්‍රවර්තී නම් රජ පෙළපතක් විසිනි. පෘතුගීසීන් මෙරටට පැමිණි අවධියේ එම පෙළපතට අයිති පරරාජසේකරම් රජු යාපනයේ පාලකයා වශයෙන් කටයුතු කළේය. කුරුඳු, ගම්මිරිස් වැනි වෙළෙඳ ද්‍රව්‍ය යාපන ප්‍රදේශයෙන් නොලැබුණු බැවින් මෙරටට පැමිණි මුල් දශකයේ දී පෘතුගීසීහු යාපනය ගැන එතරම් සැලකිල්ලක් නොදැක්වූහ. වර්ෂ 1519 දී සංකිළි නම් කුමාරයෙක් යාපනයේ බලය අල්ලා ගත් අතර 1561 දක්වා හෙතෙම එම ප්‍රදේශය පාලනය කළේය.

සංකිලි රජුගේ පාලන කාලයේ දී පෘතුගීසීන්ගේ වෙළෙඳ නැව්වලට බාධා එල්ල වීමත්, යාපනයට අයත් ප්‍රදේශවල කතෝලික ආගම පැතිර වීමට එරෙහිව සංකිලි රජු කටයුතු කිරීමත් නිසා පෘතුගීසීන් හා ගැටුම් ඇති විය. මේ අනුව වර්ෂ 1543 දී පෘතුගීසීහු රජුට එරෙහිව යාපනය ආක්‍රමණය කළහ. එහෙත් සංකිලි රජු පෘතුගීසීන් සමඟ යුද්ධයකට නොගොස් ඔවුන් ඉල්ලූ කප්පම් ගෙවීමට එකඟ වීම නිසා ගැටුම වැළකිණි.

යාපන පාලකයා සමඟ සාමය ඇති කර ගැනීමෙන් පසු පෘතුගීසි පූජකයෝ යාපනයට අයත් ප්‍රදේශවල කතෝලික ආගම පැතිර වීමට ක්‍රියා කළහ. හින්දු පූජකයන් මෙයට එරෙහි වූ හෙයින් සංකිලි රජු මන්නාරම් ප්‍රදේශයේ කතෝලික ආගම පැතිරවීමේ කටයුතුවලට බාධා ඇති කළේය. මෙහි දී සංකිලි රජු හමුදාවත් සමඟ මන්නාරම් ප්‍රදේශයට ගොස් එහි කතෝලික ආගම වැළඳගෙන සිටි අයට නැවත තම සාම්ප්‍රදායික ආගම පිළිගන්නා ලෙස නියෝග කළේය. එම නියෝගයට පිටුපෑ අයට දැඩි දඬුවම් පැමිණවීය. මන්නාරම් ප්‍රදේශයේ කතෝලික ආගම පැතිරවීමට මෙය මහත් බාධාවක් වූ බැවින් යාපනයේ පාලකයා බලයෙන් පහ කරන ලෙස මිෂනාරී පූජකවරු පෘතුගීසීන්ගෙන් ඉල්ලා සිටියහ. මේ නිසා සංකිලි රජු වර්ෂ 1548 දී සීතාවක මායාදුන්නේ රජු සමග සන්ධානයකට පැමිනුණි. පෘතුගීසි විරෝධියෙකු වූ වීදියෙ බණ්ඩාර යාපනයට පලා ගිය අවස්ථාවේ සංකිලි රජු ඔහු පිළිගත්තේය. එහෙත් මේ එකකින්වත් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි.

වර්ෂ 1560 දී පෘතුගීසීන් නැවත වරක් යාපනය ආක්‍රමණය කළ හෙයින් සංකිලි රජු අගනුවර අතහැර පලා ගියේය. අනතුරුව හෙතෙම යළිත් වරක් පෘතුගීසීන් ඉදිරිපත් කළ දැඩි කොන්දේසි මත බලය රැක ගත් නමුත් මේ අවස්ථාවේ දී මන්නාරම අල්ලා ගත් පෘතුගීසීහු එහි ආරක්ෂක බලකොටුවක් ඉදි කර ගත්හ. මන්නාරම අහිමි වීම යාපන පාලකයාට බලවත් පාඩුවක් විය. එමගින් සැලකිය යුතු භූමියක් ඔහුට අහිමි වූවා පමණක් නොව මන්නාරම අවට මුතු කිමිදීමෙන් ලැබූ ආදායමත් අහිමි විය. එසේම මන්නාරමේ සිට යාපනයේ දේශපාලන කටයුතු වලට අත දැමීමටත් පෘතුගීසින්ට අවස්ථාව ලැබුණි.

වර්ෂ 1561 දී පුවිරාජපණ්ඩරම් නම් කුමරා සංකිලි රජු බලයෙන් පහ කොට යාපනයේ බලය අල්ලා ගත්තේ ය. මෙයින් පසු යාපනයේ සිංහාසනය සම්බන්ධයෙන් උරුමකරුවන් අතර බල අරගලයක් ආරම්භ විය. මෙහි දී ඇතැමුන් පෘතුගීසි සහය සොයා ගිය හෙයින් පෘතුගීසීන්ට හිතවත් අය බලයට පත් කිරීමට හැකියාව ලැබුණි. එසේ පත් වූ පාලකයන් පවා අවස්ථාව ලැබුණු විට පෘතුගීසීන්ට එරෙහිව කටයුතු කළ හෙයින් 1591 දී පෘතුගීසීහු නැවත වරක් යාපනය ආක්‍රමණය කොට එදිරිමාන්නසිංහම් නැමැත්තෙක් තමන්ට ගැති පාලකයෙක් වශයෙන් සිංහාසනයට පත් කළහ. හෙතෙම පෘතුගීසීන්ට අවනතව කටයුතු කළ නමුත් අවස්ථා කිහිපයක දී ම උඩරට සෙනරත් රජුට යාපනයේ මුහුදු සීමාව හරහා දකුණු ඉන්දියාව සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීමට ඉඩ සලසා දුන්නේය. 1617 දී යාපනයේ පාලකයා මිය යාමත් සමඟ යළිත් එහි බල අරගලයක් ඇති විය. එහි ප්‍රතිඵල වශයෙන් සංකිලි කුමාර නම් රජ පවුලේ තැනැත්තෙක් බලය අල්ලා ගත්තේය. යාපනයේ පාලකයන් ඇතැම් අවස්ථාවල උඩරට රජුගේ වෙළෙඳ කටයුතුවලට සහාය දීමත්, දකුණු ඉන්දියාව සමඟ සබඳතා පැවැත්වීමත් පෘතුගීසීහු කිසි විටෙකත් නොඉවසූහ. මේ නිසා 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ යැවූ පෘතුගීසි හමුදාවක් විසින් යාපනය යටත්



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

කරන ලදී. අනතුරුව පෘතුගීසීන්ට එරෙහිව තවත් කැරලි කිහිපයක් ඇති වුවත් ඒවා මර්ධනය කළ පෘතුගීසීහු 1621 වන විට යාපන ප්‍රදේශයේ තම බලය පිහිටවූහ. යාපනයේ රාජ්‍ය උරුමකරුවන් අතර බල අරගල නිසා එහි ජනතාව බෙදී සිටීමත්, ප්‍රමාණවත් නිත්‍ය හමුදවක් එහි පාලකයන්ට නොසිටීමත්, උඩරටට මෙන් ස්වාභාවික ආරක්ෂාවක් නොතිබීමත් එම රාජධානියේ බිඳ වැටීමට හේතු විය.

### උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිරවීමේ ප්‍රයත්න

සීතාවක රාජධානිය බිඳ වැටීමෙන් පසු පහත රට බොහෝ ප්‍රදේශවල පෘතුගීසි බලය ව්‍යාප්ත වූ හෙයින් රටේ ස්වාධීනත්වය රැක ගැනීමේ වගකීම භාරවූයේ උඩරට රාජධානිය වෙතට ය. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයන්ගෙන් එල්ල වූ විවිධ අභියෝගවලට මුහුණ දෙමින් වර්ෂ 1815 දක්වා එම වගකීම ඉටු කිරීමට උඩරට රාජධානියට හැකියාව ලැබුණි. මෙහි දී උඩරට ප්‍රදේශ තුළ පෘතුගීසි බලය පැතිරවීමේ ප්‍රයත්න සහ ඊට එරෙහිව උඩරැටියන් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බලමු.

මහනුවර රාජධානිය හෙවත් උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිරවීමේ ප්‍රයත්න ආරම්භ වූයේ පෘතුගීසීන් කෝට්ටේ දේශපාලන කටයුතු වලට ඇඟිලි ගසමින් සිටි අවධියේ දී ම ය. I වන විමලධර්මසූරිය රජු උඩරට බලයට පත් වීමට පෙර එම රාජධානියෙහි බලය පැතිරවීමට පෘතුගීසීන් දැරූ උත්සාහයන් අටවන පරිච්ඡේදයේ දී සඳහන් කෙරිණ.

### දන්තුරේ සටන

පෘතුගීසීන් යටතේ කලක් ගත කොට ඔවුන්ගේ යුද්ධ ශිල්පය හා වෙනත් උපාය මාර්ග ගැන හොඳ අවබෝධයක් ලබා සිටි කොනප්පු බණ්ඩාර විමලධර්මසූරිය නමින් උඩරට රජ වීම ගැන පෘතුගීසීහු කිසිසේත් සතුටු නොවූහ. මේ නිසා පෘතුගීසි රැකවරණ ලබා සිටි කරලියැද්දෙ බණ්ඩාරගෙ දියණිය වූ කුසුමාසන දේවිය (දෝන කතිරිනා) උඩරටට කැඳවාගෙන ගොස් ඇය බලයට පත් කොට තමන්ට ගැති පාලනයක් පිහිටුවීමට පෘතුගීසීහු උත්සාහ කළහ. 1594 දී පෘතුගීසි කපිතාන් ජනරාල් පෙරෝ ලොපෙස් ද සූසා යටතේ දියත් කළ ආක්‍රමණයේ දී කුසුමාසන දේවිය උඩරට රැජින වශයෙන් පත් කරන ලදී. එහෙත් විදේශිකයන් බලයට පත් කළ තැනැත්තියක් රැජින වශයෙන් පිළිගැනීමට මැළි වූ උඩරැටියෝ පළමුවන විමලධර්මසූරිය රජුට සහය දුන්හ. පේරෝ ලෝපෙස් ද සූසාට තම හමුදවත් සමඟ පසු බැසීමට සිදු විය. 1594 ඔක්තෝම්බර් මාසයේ දී දන්තුරේ වෙළේ දී පෘතුගීසි හමුදව හා උඩරැටියන් අතර මහත් ගැටුමක් ඇති විය. මෙම සටනින් පෘතුගීසි හමුදව ම විනාශයට පත් වූ අතර ආක්‍රමණය මෙහෙය වූ පේරෝ ලොපෙස් ද සූසා පවා මරණයට පත් විය. එහි දී කුසුමාසන දේවිය උඩරැටියන්ගේ අත්අඩංගුවට පත් වූ අතර විමලධර්මසූරිය රජතුමා විසින් ඇය විවාහ කර ගන්නා ලදී. මේ විවාහය නිසා උඩරටට නව රාජ වංශයක් බිහි විය. උඩරට රජධානිය තුළ තමන්ට ගැති පාලනයක් පිහිටුවීමට පෘතුගීසින් දැරූ උත්සාහය අසාර්ථක වූයේ ඔවුන්ට අන්ත පරාජයක් අත් කර දෙමිනි. විමලධර්මසූරිය රජුගේ යුද්ධ උපායශීලිත්වයත්, උඩරැටියන්ගේ සහාය රජුට ලැබීමත්, පෘතුගීසීන්ගේ සහායට පහත රටින් ගිය හමුදව උඩරට දී රජුට එකතු වීමත්, විමලධර්මසූරිය රජුගේ ජයග්‍රහණයට හේතු විය.

### බලන සටන

පේරෝ ලොපේස් ද සූසා මරණයට පත් වීමෙන් පසුව පෘතුගීසීන් විසින් දොන් ජොරෙනිමෝ ද අසවේදු මෙරට කපිතාන් ජනරාල් වශයෙන් පත් කර එවන ලදී. දන්තුරේ දී පෘතුගීසීන් පරාජය වීමත් සමඟ එදිරිල්ලෙ රාල යටතේ පහතරට ප්‍රදේශවල පෘතුගීසි විරෝධි කැරැල්ලක් ඇති විය. මේ කැරැල්ලට විමලධර්මසූරිය රජුගේ සහාය ලැබුණි. මේ නිසා පෘතුගීසීහු කැරලි නායකයන් මරුමුවට පත් කොට ගම්බිම් ගිනි තබමින් දැඩි මර්දනයක් මඟින් කැරලි කරුවන් පරාජය කළහ. අනතුරුව අසවේදු උඩරට සමඟ යුද්ධයකට සැරසුණි. වර්ෂ 1602 දී ගෝවෙන් අමතර හමුදව ගෙන්වා ගත් අසවේදු දහස් ගණනක හමුදවක් සහිතව උඩරට ආක්‍රමණය කළේය. එහෙත් පෘතුගීසි හමුදවට ළඟා විය හැකි වූයේ බලන කපොල්ල දක්වා පමණි. එහි දී විමලධර්මසූරිය රජුගේ උපායක් අනුව සතුරු හමුදව වට කළ උඩරැටියෝ පෘතුගීසීන්ට දරුණු ප්‍රහාරයක් එල්ල කළහ. පෘතුගීසීන් වෙනුවෙන් සටනට ගොස් සිටි පහතරැටියෝ මෙහි දී ද විමලධර්මසූරිය රජුගේ පක්ෂයට එකතු වූහ. උඩරැටියන් එල්ල කළ ප්‍රහාර නිසා පෘතුගීසීන් සැලකිය යුතු පිරිසක් මරුමුවට පත් වූ අතර ඔවුන්ගේ අවි ආයුධ උඩරැටියන් අතට පත් විය. මෙම පරාජයත් සමඟ අසවේදු මල්වාන හරහා කොළඹට පසු බැස්සේය. අසවේදුගේ ආක්‍රමණය අසාර්ථක වීමෙන් පසුව විශාල හමුදවක් යොදගෙන උඩරට ආක්‍රමණය කිරීම වෙනුවට වරින් වර එහි

ගම්බිම් වලට පහර දෙමින් උඩරටියන්ට අලාභ හානි කිරීමේ ප්‍රතිපත්තියක් පෘතුගීසින් විසින් අනුගමනය කරන ලදී. විමලධර්මසූරිය රජුගෙන් පසු උඩරට බලයට පත් වූ සෙනරත් රජු මේ නිසා 1617 දී පෘතුගීසීන් සමඟ සාම ගිවිසුමකට එළඹුණි. එහෙත් එය නිසි පරිදි ක්‍රියාත්මක වූයේ නැත.

### රන්දෙනිවල සටන

මෙරට පෘතුගීසි කපිතාන් ජනරාල්වරයෙකු වශයෙන් කටයුතු කළ කොන්ස්තන්තීනු ද සා ඌව ප්‍රදේශය හරහා උඩරට ආක්‍රමණය කිරීම නිසා රන්දෙනිවල සටන ඇති විය. වර්ෂ 1630 ජුලි මාසයේ දී 600 ක පමණ පෘතුගීසි භට පිරිසක් සහ තවත් 4500 ක පමණ කුලී හමුදවක් සහිතව කොන්ස්තන්තීනු ද සාගේ නායකත්වයෙන් මෙම ආක්‍රමණය සිදු විය. පෘතුගීසීහු මෙහි දී බදුල්ල නගරය අල්ලාගෙන එය විනාශ කර දැමූහ. උඩරට සෙනරත් රජු තම හමුදවත් සමග බදුල්ලට පැමිණ පෘතුගීසින්ට එරෙහි ප්‍රහාරය ආරම්භ කර ඇත. සෙනරත් රජුගේ පුතෙක් වූ මහා අස්ථාන කුමරු (පසුව දෙවන රාජසිංහ රජු) උඩරට හමුදවට නායකත්වය සැපයීය. උඩරට හමුද පෘතුගීසීන් වට කළ විට පෘතුගීසීන්ගේ සහයට ගොස් සිටි පහතරට මුදලිවරු රජුට එකතු වූහ. මේ නිසා ශක්තිමත් වූ උඩරට හමුදව එල්ල කළ ප්‍රහාර හේතුවෙන් අසරණ වූ පෘතුගීසීහු වැල්ලවාය අසල රන්දෙනිවලට පසු බැස්සහ. එහිදී පෘතුගීසීන් වට කොට උඩරටියන් එල්ල කළ ප්‍රහාර නිසා පෘතුගීසීන් 350 ක් පමණ ජීවිතක්ෂයට පත් විය. තවත් පිරිසක් උඩරටියන් විසින් අත් අඩංගුවට ගන්නා ලදී. කපිතාන් ජනරාල් කොන්ස්තන්තීනු ද සා පවා මෙහිදී මරණයට පත් විය. මෙම ආක්‍රමණය පෘතුගීසීන් හදිසියේ එල්ල කළ එකක් නොව වසර දෙකක් පමණ සැලසුම් කොට කල්යල් බලා සිදු කළ එකකි. එහෙත් උඩරටියන්ගේ උපාය කෞශල්‍යය හමුවේ පෘතුගීසි සැලසුම් සියල්ල බිඳ වැටුණි.

### ගන්නෝරුව සටන

වර්ෂ 1638 මාර්තු මාසයේ දී එවකට මෙරට පෘතුගීසි කපිතාන් ජනරාල් දියෝගෝ ද මෙලෝ විසින් නැවත වරක් උඩරට ආකමණය කරන ලදී. දහසක පමණ පෘතුගීසි භට පිරිසක් සහ තවත් දහස් ගණනක කුලී හමුදවක් සහිතව ගමන් ගත් පෘතුගීස වැඩි අපහසුවකින් තොරව මහනුවර නගරයට ඇතුළු වූහ. සෙනරත් රජුගෙන් පසු බලයට පැමිණ සිටි දෙවන රාජසිංහ රජු මේ අවස්ථාවේ දී උපායශීලීව නගරයෙන් ඈත් විය. අනතුරුව කල් යල් බලා රජුගේ නායකත්වය යටතේ උඩරට හමුදව පෘතුගීසීහු වට කළහ. ගන්නෝරුවේ දී දෙපක්ෂය අතර දරුණු සටනක් සිදු විය. උඩරටියන් සුපුරුදු ලෙස එල්ල කළ ප්‍රහාර නිසා පෘතුගීසීහු මෙම සටනින් ද අන්ත පරාජයක් ලැබූහ. සටන මෙහෙය වූ දියෝගෝ ද මෙලෝ පවා ජීවිතක්ෂයට පත් විය. මෙහිදී විනාශ නොවී ඉතිරි වූ පෘතුගීසීන් සංඛ්‍යාව ගැන විවිධ වාර්තා තිබේ. ඒ හැම එකක ම සඳහන් ගණන සියයකට වඩා අඩු ය. එසේ ම උඩරට අල්ලා ගැනීමට පෘතුගීසීන් මෙහෙය වූ අවසන් ආක්‍රමණය ද එය විය.

උඩරට බලය ලබා ගැනීමට පෘතුගීසීන් එල්ල කළ සියලු ආක්‍රමණ අසාර්ථක වීමට මෙන්ම උඩරට රාජධානිය තවදුරටත් ආරක්ෂා වීමට බලපෑ හේතු කිහිපයක් තිබේ. ඒ අතර,


- උඩරට ජනතාව හැම විට ම රජුට සහාය දීම
- පෘතුගීසින් වෙනුවෙන් සටන් කිරීමට ගිය පහත රටියන් උඩරට දී රජුට එකතු වීම
- උඩරටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය
- උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීම යන කරුණු වඩාත් වැදගත් විය

## 10.3 ශ්‍රී ලංකාව හා ලන්දේසීන්

ලන්දේසීන්ගේ මව් රට ඕලන්දය වේ. පෘතුගීසින් ආසියාවට පැමිණ ශතවර්ෂයක් පමණ ගත වන විට ඔවුන් පැමිණෙන මුහුදු මාර්ග හෙළි කරගත් ලන්දේසිහු ආසියාවට පැමිණීමට පටන් ගත්හ. මුල් කාලයේ දී ඕලන්දයේ තිබූ විවිධ වෙළෙඳ සමාගම් ආසියාවට පැමිණි හෙයින් ඕලන්ද වෙළෙඳ සමාගම් අතර ම තරගයක් ඇති වීම නිසා පෙරදිග ශක්තිමත් බලයක් ගොඩනැගීමට ලන්දේසීන්ට හැකියාව නොලැබුණි. මේ නිසා 1602 දී ලන්දේසි වෙළෙඳ සමාගම් කිහිපයක් එකතු කොට පෙරදිග ඕලන්ද වෙළෙඳ සමාගම හෙවත් VOC සමාගම පිහිටුවීය. එතැන් සිට ලන්දේසීන් වෙනුවෙන් ආසියාවේ දේශපාලන කටයුතු හා වෙළෙඳ කටයුතු මෙහෙයවන ලද්දේ VOC සමාගම විසිනි. වෙළෙඳ සමාගමක මූලික අරමුණු ලාභ ඉපයීම හෙයින් ලන්දේසීන් අසියාවට පැමිණීමේ ප්‍රධාන අරමුණු ආර්ථික වාසි ලබා ගැනීම බව පැහැදිලි වේ.

ආසියාවට පැමිණි ලන්දේසිහු ජාවා දූපතේ බතාවිය


නොමිලේ බෙදා හැරීම සඳහා ය.




*සිතියම 10.1 ශ්‍රී ලංකාවේ ලංදේසි බලකොටු ස්ථාන ගත ව තිබූ ආකාරය.*

මූලස්ථානය කරගෙන පෙරදිග තම බලය පතුරුවා හැරීමට පටන් ගත්හ. ලන්දේසින් ආසියාවට පැමිණ වැඩි කල් යාමට පෙර, ඉතා හොඳ වර්ගයේ කුරුඳු හා ගම්මිරිස් වැනි වෙළෙඳ ද්‍රව්‍ය සහිත ලංකාව කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු විය. පෘතුගීසි යුද්ධවලින් පීඩා විඳිමින් සිටි උඩරට රජවරුන් ලන්දේසීන් සමඟ සබඳතා ගොඩනගා ගැනීමට කැමැත්තෙන් සිටීම නිසා මෙරටට පැමිණ ලංකාව පිළිබඳ තව දුරටත් තොරතුරු දැන ගැනීමට ලන්දේසින්ට හැකියාව ලැබිණි.

වර්ෂ 1602 දී ලන්දේසි දූතයෙකු වූ ජොරිස් වැන් ස්පිල්බර්ජන් ලංකාවට පැමිණ පළමුවන විමලධර්මසූරිය රජු හමු විය. ඊට පසු සිබල් ද වර්ට් නම් තවත් දූතයෙක් පැමිණියේය. එහෙත් මේ දූත ගමන් වලින් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි. ලන්දේසීන් හා උඩරට පාලකයන් අතර ඵලදායි සබඳතා ආරම්භ වූයේ දෙවන රාජසිංහ රජුගේ කාලයේ දී ය. පෘතුගීසීන් නිරන්තරයෙන් උඩරට සමඟ යුද්ධ කිරීම නිසා ඔවුන් මෙරටින් පලවා හැරීම දෙවන රාජසිංහ රජුගේ අරමුණ විය. ඒ සඳහා ප්‍රමාණවත් නාවික බලයක් රජුට නොතිබි බැවින් හෙතෙම ලන්දේසීන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කළේය.

දෙවන රාජසිංහ රජු හා ලන්දේසින් අතර සිදු වූ ලිපි හුවමාරු වීම් හා දූත ගමන්වල ප්‍රතිඵල වශයෙන් පෘතුගීසීන් මෙරටින් නෙරපීම සඳහා රජුට සහාය ලබා දීමට ලන්දේසීහු කැමති වූහ. ලන්දේසි නාවික හමුදා අණදෙන නිලධාරී වෙස්ටර්වල්ඩ් හා ලංකා දූතයන් අතර ඇති වූ එකඟතාව පරිදි 1638 වර්ෂයේ දී දෙපක්ෂය එකතු වී මඩකලපුවේ පෘතුගීසි බලකොටුවට පහර දුන්හ. එහෙත් බලවත් සටනක් සිදු වීමට පෙර එම බලකොටුවේ සිටි පෘතුගීසීහු යටත් වූහ. මේ නිසා මහත් සතුටට පත් වූ දෙවන රාජසිංහ රජු ලන්දේසින් සමඟ ගිවිසුමක් අත්සන් කළේය.

### 1638 උඩරට ලන්දේසි ගිවිසුමේ මූලික කරුණු

1. පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහාය දීමට ලන්දේසින් එකඟ වීම

2. ලන්දේසීන්ට වැය වන මුදල් වෙළෙඳ ද්‍රව්‍ය (කුරුඳු, ගම්මිරිස්, මී, ඉටි ආදිය) මගින් ගෙවීමට රජු එකඟ වීම

3. ඇතුන් හැර උඩරට සෙසු වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම පිළිබඳ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලැබීම

4. පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටු වල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟ වීම

වර්ෂ 1638 දී මඩකලපුව බලකොටුව යටත් කිරීමේ සිට පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීම සඳහා තවත් වසර 20 ක් ගත විය. මේ කාලයේ දී පෘතුගීසීන් සතුව තිබූ ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ, මන්නාරම හා යාපනය ඇතුළු බලකොටු උඩරට හමුදාව හා ලන්දේසීන් විසින් අල්ලා ගන්නා ලදී. මෙසේ 1658 වන විට පෘතුගීසීන් ලංකාවෙන් නෙරපා හැරීමට හැකියාව ලැබුණි. රජු හා ලන්දේසීන් අතර අත්සන් කළ ගිවිසුම අනුව පෘතුගීසීන්ගෙන් අල්ලා ගත් බලකොටුවල ලන්දේසි හමුදාව නතර කරවීම රජුගේ කැමැත්ත පරිදි සිදු විය යුතුව තිබුණි. එහෙත් එම වගන්තිය අමතක කළ ලන්දේසිහු විවිධ හේතු ඉදිරිපත් කරමින් තමන්ට වාසිදායක ප්‍රදේශවල බලකොටු රජුට භාර දීමෙන් වැළකුණි. මේ නිසා දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර හොඳ හිත පළුදු විය.


දෙවන රාජසිංහ රජු ලන්දේසීන් මෙරටට කැඳවා ගත්තේ අරමුණු දෙකක් ඉටුකර ගැනීමේ අපේක්ෂාවෙනි.

1. ලන්දේසි ආධාර ලබා ගෙන පෘතුගීසීන් ලංකාවෙන් නෙරපීම

2. පෘතුගීසීන් යටතේ තිබූ ප්‍රදේශ උඩරටට ඈඳාගෙන ස්වාධීන හා නිදහස් ලංකාවක් බිහි කිරීම

මෙම අරමුණු දෙකෙන් ප්‍රථම අරමුණ ඉටු කර ගැනීමට රජු සමත් වුවත් පෘතුගීසීන්ගෙන් නිදහස් වූ බොහෝ ප්‍රදේශවල ලන්දේසි බලය පැතිරීම නිසා දෙවන අරමුණ ඉටු කර ගත නොහැකි විය. මේ නිසා රජු ලන්දේසීන්ට පහර දෙමින් ඔවුන්ට ලබා ගත හැකි ප්‍රදේශ සංඛ්‍යාව අවම කිරීමේ උපායක් දියත් කළේය. රජුගේ මෙම උපාය නිසා 1658 වන විට ලන්දේසීන්ට ලබා ගත හැකි වූයේ ලංකාවේ පෘතුගීසීන් සතු වූ භූමියට වඩා අඩු භූමි ප්‍රමාණයකි.

දෙවන රාජසිංහ රජු යනු පළමුවන විමලධර්මසූරිය රජුට පසු උඩරට රාජධානියට නව වැදගත්කමක් ලබා දුන් අයෙකි. ලන්දේසීන් සමඟ ලිපි ගනුදෙනු වල දී තමා ලංකාවේ අධිරාජයා බවට රජු ප්‍රකාශ කළේය. ලන්දේසින් ද එබඳු ලිපි ගණුදෙනු වලදී රජු "ත්‍රිසිංහලාධීශ්වර" යැයි නාමිකව හෝ පිළිගෙන තිබුණි. රජු ලන්දේසින්ට ලිපි ලියන විට "මට



*ඡායාරූපය 10.2 උඩරට නායකයින් ලංදේසින් හමුවී.*

සේවය කරන හිතවත් ලන්දේසි ජාතිය" වැනි පාඨ යෙදූ අතර ලන්දේසීන් ද රජුට ලිපි ලියන විට "ඔබ වහන්සේගේ සුවච කීකරු සේවක" වැනි පද යොදා ගනු ලැබීය. වර්ෂ 1665 1668 කාලයේ ලන්දේසීහු ප්‍රහාර මාලාවක් දියත් කර උඩරටට අයත් ප්‍රදේශ කිහිපයක් අත්කර ගත්හ. එහෙත් 1770 1775 කාලයේ දී දෙවන රාජසිංහ රජු එල්ල කළ ප්‍රහාර මාලාවක් නිසා ලන්දේසීන්ට අයත් ප්‍රදේශ රැසක් ඔවුන්ට අහිමි විය. මේ නිසා උඩරැටියන් සමඟ සටන්වලට යාම තම විනාශයට හේතු වන බව තේරුම් ගත් ලන්දේසිහු 1770 පසු ශතවර්ෂයක් තරම් කාලයක් උඩරට සමඟ ගැටීම්වලින් වැළකී සිටීමට උත්සහ කළහ.

- උඩරට රාජ්‍ය සම්බන්ධ ලන්දේසීන්ගේ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ

  I. ලන්දේසි වෙළෙඳ සමාගමට පාඩු සිදු වන ගැටුම්වලින් වැළකී උඩරට සමඟ සාමකාමීව කටයුතු කිරීමට ලන්දේසීන් උත්සාහ දැරීම

  II. උඩරට රජුගේ හොඳ හිත දිනා ගැනීමට රජුට තෑගි බෝග ලබා දීම, රජු හමු වීමට දූත පිරිස් යැවීම, රජු සමඟ ලිපි හුවමාරු කරගැනීම, මෙම කටයුතු මඟින් රජුගේ හොඳ හිත දිනා ගෙන උඩරට වැවෙන කුරුඳු තමන් වෙතට ලබා ගැනීම ලන්දේසින්ගේ අපේක්ෂාව විය

  III. උපසම්පදාව ගෙන ඒම වැනි රජුගේ ආගමික කටයුතුවලට අවශ්‍ය නැව් සපයා දීම

  දෙවන විමලධර්මසූරිය රජුට, විජය රාජසිංහ රජුට හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුට මෙබඳු කටයුතුවලට ලන්දේසීහු නැව් සපයා දුන්හ.

- උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ ලන්දේසි ප්‍රතිපත්ති.

  I. උඩරට රජු වෙනත් විදේශිකයන් සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීම ලන්දේසීහු හැකි තරම් අවහිර කළහ.

  II. රජු සමඟ මත ගැටුම් ඇති වූ විට උඩරට හා පහතරට අතර කඩවත් වසා දැමීම.

  III. පහත රට ඇතැම් ප්‍රදේශවල වී වගාව දියුණු කිරීමට ලන්දේසින් කටයුතු කිරීම. මෙමඟින් විදේශවලින් සහල් ආනයනයට යන වියදම අවම කර ගැනීමට ලන්දේසීහු අපේක්ෂා කළහ

  IV. කුරුඳු වගා කරවීම හා කුරුඳු වගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීම. කුරුඳු වෙළෙඳාමෙන්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ලන්දේසීන්ට විශාල ලාභයක් ලබා ගත හැකි නිසා මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළහ

V. ලන්දේසින්ට ලාභ ලැබිය හැකි උක් වගාව, කෝපි, කපු ආදිය වගා කරවීමට ක්‍රියා කිරීම

## උඩරට රාජ්‍ය හා ලන්දේසීන් අතර ගැටුම් ඇති වීම

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය වන විට එතෙක් ලන්දේසි පාලනයෙන් පිඩාවට පත්ව සිටි පහත රටියෝ තමන් වෙනුවෙන් මැදිහත් වන ලෙස උඩරට රජුගෙන් ඉල්ලා සිටියහ. වර්ෂ 1760 අවසාන භාගයේ මීගමුව හා මාතර වැනි ප්‍රදේශවල ලන්දේසි විරෝධී කැරලි ඇති විය. රජු ගලගොඩ අධිකාරම් යටතේ පහතරට ප්‍රදේශයට හමුදාවක් එවූ අතර එම හමුදාවෝ ක්ෂණික ප්‍රහාර කිහිපයක් එල්ලකොට කටුවන කොටුව, මාතර කොටුව ඇතුළු ස්ථාන කිහිපයක් යටත් කළහ. පසුව ලන්දේසිහු මෙම ස්ථාන නැවත අල්ලා ගත්හ.

වර්ෂ 1764 දී ලන්දේසීහු බැරන් වැන් එක් ආණ්ඩුකාරවරයාගේ මෙහෙයවීම මත සේනාංක 6 ක් යොදා ගනිමින් උඩරට ආක්‍රමණය කළහ. එහෙත් මේ සේනාංක හයෙන් එකකටවත් මහනුවරට ළඟා වීමට ඉඩ නොලැබුණි. සුපුරුදු ප්‍රහාර මඟින් උඩරැටියෝ මේ සේනාංක පරාජය කළහ.

වර්ෂ 1765 දී ලන්දේසිහු නැවත වරක් උඩරට ආක්‍රමණය කළහ. උඩරැටියන්ගේ ප්‍රහාරවලට මුහුණ දෙමින් මෙවර ලන්දේසිහු මහනුවරට ඇතුළු වීමට සමත් වූහ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සාමයක් ඇති කර ගැනීමට කැමැත්ත දක්වූ හෙයින් ලන්දේසිහු තමන්ට වාසිදායක කොන්දේසි මාලාවක් ඉදිරිපත් කළහ. එහෙත් ලන්දේසීන් ඉදිරිපත් කළ අසාධාරණ කොන්දේසි පිළිගැනීමට රජු අකමැති විය. මේ නිසා නගරය කොල්ල කෑ ලන්දේසීහු මාසයකට වැඩි කලක් එහි ගත කළහ. එහෙත් ආහාර හිඟය, ලෙඩ රෝග හා වැසි සමය ආරම්භ වීම නිසා ලන්දේසිහු මහනුවර අතහැර නැවත කොළඹට පැමිණියහ.

ලන්දේසින්ගේ ආක්‍රමණ තර්ජන හා වසර කිහිපයක් ඇදී ගිය යුද්ධවලින් පීඩා විඳීම නිසා වර්ෂ 1766 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසින් සමඟ සාම ගිවිසුමක් අත්සන් කළේය. 1766 ගිවිසුම නිසා උඩරට රාජධානියට වෙරළබඩ තීරයක් අහිමි විය. උඩරට සාම්ප්‍රදායික වෙළෙඳාමට ද මෙමඟින් පහර වැදුණි. ලංකාවේ ලන්දේසින් සතුව පැවති ප්‍රදේශවල ලන්දේසින්ට ඇති අයිතිය ගිවිසුමෙන් පිළිගැනුණි. ගිවිසුමේ ඇතුළත් තවත් වගන්ති රැසකින් ම වාසි අත්වූයේ ලන්දේසීන්ට ය. මේ නිසා ගිවිසුමේ කොන්දේසි ලිහිල් කර ගැනීමට උඩරැටියන් ලන්දේසින් සමඟ සාකච්ඡා පැවැත් වූ නමුත් ලන්දේසිහු එයට එකඟ නොවූහ. අවසානයේ එය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක නොවන තැනට පත් කිරීමට උඩරැටියෝ කටයුතු කළහ.

### ක්‍රියාකාරකම

1. කෝට්ටේ සහ යාපනය රාජ්‍ය පෘතුගීසින් සතු වීමට එක් හේතුවක් වූයේ එම රාජ්‍යවල පැවති අභ්‍යන්තර ගැටුම් ය. රටක අසමගිය එම රටේ විනාශයට හේතු වන බව මේ ඇසුරින් පැහැදිලි කරන්න.

2. පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ ලංකාවේ දේශපාලන තත්ත්වය විස්තර කරන්න.

### වැදගත් කරුණු

1. ආර්ථික වාසි ලබා ගැනීම, ආගම ප්‍රචාරය කිරීම වැනි අරමුණු ඇතිව යුරෝපීයයන් මුලින්ම ආසියාවට පැමිණියත් කලින් කලට යුරෝපයේ ඇති වූ වෙනස්කම් සමඟ ඔවුන්ගේ අරමුණු වෙනස් විය.

2. පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට දේශපාලන එක්සත්කමක් නොතිබීම ඔවුන්ගේ බල ව්‍යාප්තියට උපකාරි විය.

3. කෝට්ටේ පාලකයා වූ ධර්මපාල රජු පෘතුගීසීන්ට හිතවත්ව කටයුතු කිරීම නිසා එම රාජධානිය තුළ මුලින් ම පෘතුගීසි බලය පැතිරුණි

4. 16 වන සියවස තුළ සීතාවක රාජධානියේ පාලකයෝ ප්‍රබල පෘතුගීසි විරෝධි සටනක නිරත වූහ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

5. උඩරට රාජධානිය තුළ පෘතුගීසි බලය පැතිර වීමේ ප්‍රයත්නය නිසා උඩරැටියන් සහ පෘතුගීසින් අතර සටන් කීපයක් සිදු විය.

6. උඩරට රාජධානියේ පාලකයෝ පෘතුගීසීන් පන්නා දැමීම සඳහා ලන්දේසීන්ගේ සහය ලබා ගත්හ.

7. උඩරට රජවරුන් සහ ලන්දේසීන් අතර විවිධ ගැටුම් ඇති විය.

මෙම පාඩම් පොතේ ඇතුළත් කරුණු උපුටා ගැනීමට භාවිත කරන ලද විවිධ ලිපිලේඛන අතුරින් ඉතා වැදගත් ලේඛන කිහිපයක් මෙහි පහත දක්වා තිබේ. එය ප්‍රධාන වශයෙන් ගුරුවරුන්ගේ පහසුව සඳහාත් ශිෂ්‍යයාට වැඩිදුර උදව් කිරීම සඳහා අවශ්‍ය වන්නේ නම් දෙමව්පියන්ට හෝ වෙනත් වැඩිහිටියෙකුට ඒ සඳහා භාවිත කළ හැකි අත්වැලක් වශයෙනි. කිසිවිටෙකත් මෙම මූලාශ්‍රය ශිෂ්‍යයා විසින් අනිවාර්යයයෙන් ආශ්‍රය කළ යුතු යැයි මෙහි දී අදහස් නොකෙරේ. මෙහි ඇතුළත් කර තිබෙන්නේ දැනට ප්‍රකාශිත මූලාශ්‍රය පමණි.

*Bandaranayake S., 1992. 'The Settlement Patterns of the Proto historic and Early historic interface in Sri Lanka'. South Asian Archaeology 1989 Papers from the Tenth International Conference of South Asian Archaeologists in Western Europe, Musee National Des Arts Asiatiques Guimet, Paris, France, 3-7 July 1989. Monograph in World Archaeology No 14.*

*Bandaranayake S., 2012 (reprint). 'Feudalism revisited: problems in the characterization of historical societies in Asia - the Sri Lankan configuration'. Continuities and Transformations. Studies in Sri Lankan Archaeology and History. Colombo: Social Scientists Association.*

*Deraniyagala S., 1988. Prehistory of Sri Lanka. an ecological perspective. Cambridge: Harvard University*
*Ellepola C., 1990. 'Conjectured Hydraulics of Sigiriya'. Ancient Ceylon No.11, 169-228pp.*

*Gunawardhana R.A.L.H., 1982. 'Prelude to the State: An Early phase in the Evolution in Ancient Sri Lanka'. The Sri Lanka Journal of the Humanities Vol. VIII. 1&2, 1-30pp.*

*Gunawardhana R.A.L.H., 1983. 'Cistern Sluice and Piston Sluice' (Some observation on Types of Sluices and Method of Water distribution in Pre-Colonial Sri Lanka). The Sri Lanka Journal of the Humanities IX (1&2), 87-104pp.*

*Lakdusnghe S., 1994. 'Oil Lamp'. Sacred Images of Sri Lanka. Sydney: The Art Gallery of New South Wales*

*Paranavitana S., 1970. Inscriptions of Ceylon. Brahmi Inscriptions, Part I. Colombo: Department of Archaeological Survey*

*Paranavitana S., 1983. Inscriptions of Ceylon. Later Brahmi Inscriptions. Colombo: Department of Archaeological Survey.*

*Premathilake R., 2003. Late quaternary Palaeoecological event Stratigraphy in the Horton Plains, Central Sri Lanka with contribution to the recent pollen flora. Stockholm: Department of Physical Geology*

*Somadeva R., 2010. Archaeology of the Uda Walave Basin. Colombo: Postgraduate Institute of Archaeology*

*සෝල්ලංගආරච්චි ආර්., 1997. ශ්‍රී ලංකාවේ ලෝහවිද්‍යාවේ ඉතිහාසය. විදුරාව වෙළුම 19, අංක 1, දේශීය දැනුම කලාපය*